# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම BUCU – 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ප්‍රාග් වෛදික ආගමික ප්‍රතිපදාව තුළ ශ්‍රමණ සම්ප්‍රදාය පැවති බවට ඉදිරිපත් වන සාක්ෂි අදාළ මූලාශ්‍රය ඇසුරෙන් පෙන්වා දෙන්න.

02. වෛදික යුගයේ දේවගනයාගේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වය ස්වභාව ධර්මයේ අංගයන් හා බැඳී තිබූ ආකාරය ප්‍රකට කරන්න.

03. වෛදික බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙන් ඉදිරිපත්වන නිර්මාණවාදී ඉගැන්වීම් බුදුදහමෙන් ප්‍රතික්ෂේප වන ආකාරය සකාරණව පැහැදිලි කරන්න.

04. බුද්ධකාලීන ශ්‍රමණ සම්ප්‍රදාය තුළ පැවති විවිධතා හා සුවිශේෂතා පැහැදිලි කරන්න.

05. අකිරියවාදි හා නියතිවාදි ඉගැන්වීම්වල මූලික වෙනස්කම් තුලනාත්මකව සාකච්ඡා කරන්න.

06. ආකාරවතී ශ්‍රද්ධාවේ හා අමූලිකා ශ්‍රද්ධාවේ මූලික වෙනස්කම් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

07. පුද්ගල හා සමාජ පැවැත්ම හොඳ නරක විනිශ්චය පිළිබඳ බෞද්ධ නිර්ණායක තුළින් තහවුරු කොට ඇති ආකාරය පෙන්වා දෙන්න.

08. දෛනික ජීවිතයේ ගැටලු අවබෝධය හා නිරාකරණයෙහි ලා චතුරාර්ය සත්‍යය පිළිබඳ ඉගැන්වීම් උපයෝගී කොටගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

09. පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය සඳහා ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධය කෙසේ ඉවහල් වන්නේ දැයි ප්‍රකට කරන්න.

10. නිදහස් චින්තනය පුද්ගලයාගේ ලෞකික හා ලෝකෝත්තර අරමුණු සාධනයට ඉවහල් වන ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

***********************************